# පරිසර අමාත්‍යාංශය

## කෘෂිකර්ම, වනාන්තර සහ වෙනත් ඉඩම් පරිහරණ (AFOLU) ක්ෂේත්‍රය සඳහා විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ රාමුවක් (Enhanced Transparency Framework) සකස් කිරීමේ ව්‍යාපෘතියට උපදේශකවරු තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකාව 1993 සිට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) සඳහා පාර්ශවකරුවෙකු වන අතර, 2016 දී පැරිස් ගිවිසුම අපරානුමත කර ඇත. පැරිස් ගිවිසුමෙහි 13 වන වගන්තියෙහි සඳහන් සැලසුම් ගත විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ රාමුව (ETF) සඳහා ගණනය, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) ස්ථාපිත කළ යුතුවේ. විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ ආකෘතීන්, ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය විසින් සකස් කර ඇත. ඒ අනුව, පරිසර අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි ජාතික කේන්ද්‍රීය මධ්‍යස්ථානය වෙමින්, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම, වනාන්තර සහ වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා MRV පද්ධතියක් හා විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ රාමුවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරයි.

ගෝලීය පාරිසරික පහසුකම් (GEF) ආයතන විසින් පාරදෘශ්‍යභාවය සඳහා ධාරිතාව ගොඩනැංවීමේ මූලාරම්භය (CBIT) තුළින් විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ රාමුව සමග අනුගතවෙමින්, සංවර්ධනය වෙමින් පවත්නා රටවල ධාරිතාවය ගොඩනැංවීම සඳහා මූල්‍යාධාර සපයනු ලබයි. මේ පිළිබඳව, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම, වනාන්තර සහ වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රයෙහි දේශගුණ ක්‍රියාකාරකම්වල පාරදෘශ්‍යභාවය සහතික කරනු පිණිස ඉහත ව්‍යාපෘතිය සකස් කර ඇත.

ඉහත ව්‍යාපෘතිය සඳහා පරිසර අමාත්‍යාංශය විසින් පහත සඳහන් උපදේශකවරු සේවයෙහි යෙදවීම උදෙසා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| **තොරතුරු තාක්ෂණ උපදේශක (MRV)** | **තනතුරු 01** |
| **මූල්‍ය හා ප්‍රසම්පාදන උපදේශක** | **තනතුරු 01** |

ඉහත තනතුරු සඳහා සම්පූර්ණ කළ අයදුම්පත් හා තාක්ෂණික යෝජනා ඉදිරිපත් කරන ලෙසට සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. කෙටි ජීව දත්ත විස්තරයක් සමග අදාළ අයදුම්පත් හා තාක්ෂණික යෝජනා ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය (6 වන මහල), පරිසර අමාත්‍යාංශය, සොබාදම් පියස, 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල යන ලිපිනයට එවීමට හෝ ඉහත ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2023 සැප්තැම්බර් 07 වන දින පස්වරු 2.00 ට පෙර බහාලීම මගින් ඉල්ලුම් කළ හැක.

අදාළ කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"අයදුම් කරනු ලබන තනතුර"** සඳහන් කළ යුතුය. ඉහත උපදේශක තනතුරු සඳහා වන කාර්ය නිර්ණය (ToRs) තාක්ෂණික යෝජනා හා අයදුම්පත් සඳහා ආකෘති පත්‍ර www.climatechange.lk සහ www.env.gov.lk වෙතින් බාගත හැක.

**ලේකම්**
**පරිසර අමාත්‍යාංශය**
**බත්තරමුල්ල.**